# මධ්‍යම සංස්කෘතික අරමුදලේ කතරගම කෞතුකාගාරය
# ප්‍රතිසංවිධාන කටයුතු සඳහා
# උපදේශකත්වය ලබා ගැනීම

- බුද්ධශාසන , ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති මධ්‍යම සංස්කෘතික අරමුදල මඟින් ක්‍රියාත්මක රුහුණු මාගම්පුර ව්‍යාපෘතියේ කතරගම කෞතුකාගාරය ප්‍රතිසංවිධානය කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය පහත සඳහන් උපදේශකවරුවන්ගේ සේවය ලබා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

- මේ සඳහා අයදුම් කිරීමට කැමති අදාල විෂය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම ඇති විශේෂඥයන් 2026. 05.15 දින වන විට පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ විද්‍යුත් ලිපිනයට යොමු කළ හැකිය.

  **අධ්‍යක්ෂ ජනරාල්, මධ්‍යම සංස්කෘතික අරමුදල, 212/1, බෞද්ධාලෝක මාවත, කොළඹ 07,**
  **විද්‍යුත් ලිපිනය officerda147@gmail.com**

අවශ්‍ය උපදේශක සේවාවන්

1. පුරාවිද්‍යා උපදේශක

   අපේක්ෂිත උපදේශකත්වය :-

   හින්දු වතාවත් පිළිබඳ විශේෂඥ උපදේශක සමඟ සම්බන්ධ වී කෞතුකාගාරයේ ප්‍රදර්ශන තේමාව, story line යනාදිය සකස් කිරීම, ප්‍රදර්ශන සඳහා අවශ්‍ය පුරාවස්තු, භාණ්ඩ හඳුනා ගැනීම, ඒවා ප්‍රදර්ශන ශාලාවේ ස්ථානගත කිරීමට අදාල උපදෙස් ලබා දීම හා අභ්‍යන්තර සැළසුම් උපදේශක ට අවශ්‍ය විශේෂඥ තොරතුරු හා අවශ්‍ය සහය ලබා දීම හා ප්‍රදර්ශන කටයුතු සාර්ථක කර ගැනීමට අවශ්‍ය සියළු උපදේශකත්වය (විස්තරාත්මක පුවරු සඳහා අවශ්‍ය සැළසුම් හා text වලට අදාල තොරතුරු ලබා දීම ද ඇතුළුව)

   අවශ්‍ය සුදුසුකම් :- පුරාවිද්‍යාව පිළිබඳ විශේෂවේදි උපාධියක් සහිතව පුරාවිද්‍යාව පිළිබඳ දර්ශනශූරී උපාධියක් තිබීම, පුරාවිද්‍යාඥයින්ගේ සභාවේ සාමාජිකත්වය ලබා තිබීම හා රුහුණු කතරගම ප්‍රදේශය පිළිබඳව පුරාවිද්‍යාත්මක පර්යේෂණ සිදුකර තිබීම.

2. හින්දු වතාවත් පිළිබඳව විශේෂඥ උපදේශක

   අපේක්ෂිත උපදේශකත්වය :-

   කතරගම දේවාලය, පුදබිම, පෙරහැර හා බැඳුණු සියළු හින්දු ආගමික විශ්වාසයන්, චාරිත්‍ර, වාරිත්‍ර, ඇදහිලි, සම්ප්‍රදායන් හා කතරගම දේවාලය හා පුදබිමේ ජාතික වැදගත්කම, මෙම පුදබිම හා බැඳුණු අන්‍ය ආගමික සම්ප්‍රදායන්, විශ්වාසයන් යනාදිය පිළිබඳ නරඹන්නන්ට ඉතා හොඳින් සන්නිවේදනය කිරීම සඳහා වන ප්‍රදර්ශන තේමාව හා story line යනාදිය පුරාවිද්‍යා උපදේශක සමඟ සම්බන්ධ වී සකස් කිරීම, ප්‍රදර්ශන සඳහා අවශ්‍ය පුරාවස්තු, භාණ්ඩ හඳුනා ගැනීම, ඒවා ප්‍රදර්ශන ශාලාවේ ස්ථානගත කිරීමට අදාල උපදෙස් ලබා දීම හා පුරාවිද්‍යා උපදේශක හා අභ්‍යන්තර සැළසුම්

උපදේශක ට අවශ්‍ය විශේෂඥ තොරතුරු හා අවශ්‍ය සහය ලබා දීම හා ප්‍රදර්ශන කටයුතු සාර්ථක කර ගැනීමට අවශ්‍ය සියළු උපදේශකත්වය (විස්තරාත්මක පුවරු සඳහා අවශ්‍ය සැළසුම් හා text වලට අදාල තොරතුරු ලබා දීම ද ඇතුළුව)

අවශ්‍ය සුදුසුකම් :- හින්දු සංස්කෘතිය, වතාවත් යනාදිය ආවරණය වන උපාධියක් තිබීම, හින්දු සංස්කෘතිය හා ඇදහිලි, විශ්වාස,සම්ප්‍රදායන් (විශේෂයෙන්ම කතරගම හා බැඳුනු) යනාදිය පිළිබද විශේෂඥයකුවීම.

3. අභ්‍යන්තර සැළසුම්උපදේශක

අපේක්ෂිත උපදේශකත්වය :-

පුරාවිද්‍යා උපදේශක හා හින්දු වතාවත් පිළිබඳව විශේෂඥ උපදේශක සමඟ සාකාච්ඡා කර පුරාවස්තු හා ප්‍රදර්ශන භාණ්ඩ ප්‍රදර්ශනය සඳහා වූ ප්‍රදර්ශන සැළසුම් සකස් කිරීම, ප්‍රදර්ශන අල්මාරි, පීඨිකා යනාදිය නිර්මාණය, විදුලි ආලෝකකරණය ඇතුළු අභ්‍යන්තර සැළසුම් නිර්මාණය, විස්තරාත්මක පුවරු හා ප්‍රදර්ශන පනේල වල Graphic නිර්මාණ ඇතුළු ප්‍රදර්ශන කටයුතු සාර්ථක කර ගැනීමට අවශ්‍ය සියළු උපදේශකත්වය

අවශ්‍ය සුදුසුකම් :- වරලත් වාස්තු විද්‍යාඥයකු වීම, කෞතුකාගාර මැදිරි වල අභ්‍යන්තර සැළසුම් සකස් කිරීමේ පළපුරුද්ද පිළිබද සහතික හා ඒ හා සමාන අත්දැකීම් තහවුරු කර ගැනීමේ ලිඛිත ලේඛන

උපදේශකත්වය මාස 03 ක කාලයක් වන අතර උක්ත උපදේශක සේවාවන් සඳහා පත්කරගනු ලබන උපදේශකයෙකු වෙනුවෙන් ගරු දීමනාවක් ලෙස මසකට රු. 80,000/= ක මුදලක් ලබා දීමට අපේක්ෂා කෙරේ.